වෛද්‍යවරයෙකු විසින් අනවසරයෙන් වෛද්‍යවරියකගේ නිරුවත් ඡායාරූප ගැනීමේ පුවතක් මාධ්‍ය ඔස්සේ අනාවරණය වී තිබිණි. මේ අතර දිවයින ඉරිදා සංග්‍රහයේ (07/18) ද මෙම පුවත පළ වන්නේ "රාගම වෛද්‍යවරියගේ අරවගේ පිංතූර ගත් කොළඹ දොස්තර" යන සිරස්තලයෙනි. මේ සම්බන්ධයෙන් පාඨක අප ප්‍රශ්න කළ යුතු යැයි අප සිතන කරුණු මෙසේ පෙළගැස්විය හැක.

1) මෙවැනි සිරස්තලයක භාෂා භාවිතය ශිෂ්ට සම්පන්න යැයි අපට ගත හැකිද?

2) සිරස්තලය සහ අන්තර්ගතය යන දෙකම භාවාතිෂය ආකාරයකින් ලියවී ඇතැයි ඔබ නොසිතන්නේද? ඒ අනුව, මෙම සිදුවීමේ සැබෑ සමාජ ගැටළුව යටපත්ව, හුදු භාවාතිෂය කතාන්තරයක් පමණක් ඉතුරු නොවන්නේද?

3) අනවසරයෙන් තවත් අයෙකුගේ නිරුවත ඡායාරූප ගත කිරීම වරදක් බව නොකිවමනායි. එසේ නම්, එය "නග්න සිරුරේ සුන්දරත්වය විඳීමක්" ලෙසට උත්කර්ෂයට නැංවීම නොමනා නොවන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

#MediaEthicsSL #lka #sinhalanews #SundayDivaina